**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


මගේ අංකය / எனது இல. / My No. }    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2024.05.80

පැමිණිලි පාර්ශවය : පී.පී.කේ විදාරත්න මයා,
47, 1/1, සිරිධම්ම මාවත,
කොළඹ 10.

වගඋත්තර පාර්ශවය : 01. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත මයා,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යංශය,
බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

02. වෛද්‍ය දේදුනු ඩයස් මයා,
අධ්‍යක්ෂ (වැඩ බලන)
වෛද්‍ය ආයතනය,
තැ.පෙ 527, කොළඹ 08.

<u>පැමිණිලි අංකය : **HRC/1650/23**</u>

<u>පැමිණිල්ල :-</u>

ඉහත පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, ඉහත සඳහන් වගඋත්තරකාර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරට සුදුසුකම් ලත් නිලධාරියෙකු පත් කිරීම සඳහා අභ්‍යන්තර අයදුම්පත්‍ර කැඳවීමෙන් අනතුරුව විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් (MRI/EB/MLT/2017(1)




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

හා 2023.02.24 දිනැති ලිපිය මගින් කැඳවීම කර 2023.03.07 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද බවයි. එම සම්මුඛ පරීක්ෂණයට අනුව පැමිණිලිකරු ඉහළම සුදුසුකම් අනුව රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරට තේරී පත්වුවද පැමිණිලිකරුට වඩා අඩු සුදුසුකම් ඇති පුද්ගලයෙකු අදාළ තනතුරට තොරා පත්කරගැනීම තුළින් පැමිණිලිකරුගේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වූ බවට පැමිණිලි කර ඇත.

ඒ අනුව, ඉහත තෝරාගැනීම අවලංගු කර සම්මුඛ පරීක්ෂණයේදී ඉහළ ලකුණු ලැබ සුදුසුකම් ලැබූ තමාව එම තනතුරට පත් කරන ලෙස පැමිණිලිකරු විසින් 2023.04.21 වන දිනැති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති උක්ත පැමිණිල්ලෙන් වැඩිදුරටත් ඉල්ලා සිට ඇත.

මෙම පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණ කටයුතු සිදුකර ඇති අතර, එහිදී පැමිණිලිකරු විසින් සිය කරුණු ඉදිරිපත් කිරීම මගින් කියා සිටින්නේ, විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අභිබවා කටයුතු කරමින් තමාට වඩා අඩු ලකුණු ලබාගත් අයෙක් අදාළ තනතුරට පත්කිරීමට කටයුතු කිරීම තුළින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබූ බවයි.

**වගඋත්තර පාර්ශවයේ කරුණු ඉදිරිපත් කිරීම :-**

පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින්, වගඋත්තර පාර්ශවය වෙනුවෙන් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ (වැ.බ) විශේෂඥ වෛද්‍ය දේදුනු ඩයස් යන අය විසින් අංක MRI/EB/MLT/2017(1) හා 2023.08.24 දිනැති වාර්තාව මගින් සඳහන් කර ඇත්තේ, නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරියෙකු පත්කිරීම සඳහා 2023.02.03 ලිපිය මගින් අයදුම්පත් කැඳවූ බවත්, එම අයදුම්පත් ඇගයීම් සඳහා නිලධාරීන් 5 දෙනකුගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් 2023.03.07 දිනැති ලිපිය මගින් පත් කරගත් අතර, ඉහත තනතුර සඳහා නිලධාරීන් දෙදෙනෙකු අයදුම්පත් ඉදිරිපත් කර තිබූ බවත්, සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය 2023.03.07 දින පවත්වන ලද බවත්ය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් පරීක්ෂා කරන ලද නිර්ණායක අනුව ඉහළ ලකුණු ලබාගත් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරට මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන ජී.ජී.කේ විද්‍යාරත්න මහතා නිර්දේශ වූ බවද දක්වා ඇත. කෙසේ වුවද, මෙම තනතුරට නිලධාරියෙකු පත්කිරීම සම්බන්ධයෙන් විවිධ මතවාද තිබූ බැවින් ඒ පිළිබඳව නැවත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කරන ලද නමුදු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් ඒවා සැළකිල්ලට නොගෙන පැමිණිලිකාර වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ජී.ජී.කේ විද්‍යාරත්න යන අය අදාළ තනතුරට සුදුසු බවට නිර්දේශිත වාර්තාව ලැබුනු බව දක්වා ඇත.

මෙහිදී ආයතනයේ රාජකාරී නිසි පරිදි ඉටු කිරීමට විය හැකි බාධක සලකා බලා අදාළ පත්කිරීම සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වැඩිදුරටත් උපදෙස් ලබාගැනීම සඳහා ලිපියක් යොමු කළ බවත්, උක්ත ලිපියට පිළිතුරු වශයෙන් සෞඛ්‍ය ලේකම් විසින් මෙම ආයතනයේ රසායනාගාර වල සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා ලේඛනය අනුව ඉල්ලුම්පත් කැඳවන ලෙස උපදෙස් ලබා දුන් බවත්, ඒ අනුව වගඋත්තරකාර වෛද්‍ය දේදුනු ඩයස් යන විසින් මෙම තනතුර සඳහා නැවතත් අයදුම්පත් කැඳවන ලද බවත්, දක්වා ඇත. එහිදී වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ජී.ආර්.කේ කලුගම්පිටිය යන අය මෙම තනතුර සඳහා සුදුසු බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර තිබීමට අනුව ඔහුව 2023.05.29 දිනැති ලිපිය මඟින් පත්කළ බව වැඩිදුරටත් දක්වා ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලිකරු වන ජී.ජී.කේ විද්‍යාරත්න යන අය සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන වෛද්‍ය පර්යේෂණ කාර්මික විද්‍යාඥ පුහුණු පාසලේ ආචාර්යවරයෙකු ලෙස සේවය කරන අතර, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්පත්‍ර කැඳවීමේදී ඔහුද ඒ සඳහා ඉල්ලීම් කර ඇත.

ඒ සඳහා වූ සම්මුඛ පරීක්ෂණය 2023.03.07 දින පැවැත්වූ අතර, එම සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණිලිකරු ද සහභාගී වී ඇත. වෛද්‍ය පර්යේෂණ ආයතනයේ එවකට හිටපු වැඩ බලන අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය දේදුනු ඩයස් මහතා විසින් විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබූ අතර, උක්ත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති වශයෙන් විශේෂඥ වෛද්‍ය රේණුකා ජයතිස්ස මිය ඇතුළු විශේෂඥ වෛද්‍ය කාන්ති නානායක්කාර මිය, ඩබ්.ඩී.එම් ප්‍රියදර්ශනී මිය, පරිපාලන නිලධාරිණී, හේමමාලා නවරත්න මිය, විශේෂ ශ්‍රේණියේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ කේ.පී.ආර් ප්‍රේමවංශ මයා, නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ යන අය පත්ව ඇත.

උක්ත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ 2023.03.09 දිනැති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් 5 දෙනාම එකඟ වූ නිර්දේශය අධ්‍යක්ෂ වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙත ඉදිරිපත් කර ඇති අතර, උක්ත නිර්දේශයට අනුව පැමිණිලිකාර වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ජී.ජී.කේ විද්‍යාරත්න මහතා 91.4 % ක්ද, ඔහු සමඟ ඉදිරිපත් වූ අනෙක් අයදුම්කරු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ජී.ආර්.කේ කලුගම්පිටිය මහතා 77.6% ක්ද වශයෙන් ලකුණු ප්‍රතිශතයක් ලබාගෙන ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ජී.ජී.කේ විද්‍යාරත්න මහතා නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා තෝරා ගැනීම සුදුසු බවට නිර්දේශ කර ඇති බවටද තවදුරටත් නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත්, වගඋත්තරකාර වැඩබලන අධ්‍යක්ෂ වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් ලිඛිත දේශනයේ සඳහන් කර ඇති ආකාරයට වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරීන්ගෙන් විවිධ මතවාද ඉදිරිපත් වූ බවත්, එම මතවාද සහිත ලිපි නැවත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත යොමු කරන ලද බවත් දක්වා ඇතත්, එම මතවාදවලට පාදක වූ කාරණා පිළිබඳව සොයා බැලීමේදී කිසිදු පිළිගතහැකි පදනමක් හෝ හේතුවක් නොමැති බවට නිරීක්ෂණය වේ. එනම්, වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින් විසින් වෛද්‍ය රසායනාගාර ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2023.03.08 දිනැති ලිපියක් ඉදිරිපත් කරමින් වෛද්‍ය පර්යේෂණ කාර්මික විද්‍යාඥ පුහුණු පාසල වෙනමම පවතින ආයතනයක් බවත්, උක්ත පාසල තුළ ඉගැන්වීම් කටයුතු සිදුවන අතර, ප්‍රායෝගිකව වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥවරයාගේ සේවයක් නොපවතින බවත්, නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥවරයෙකුගේ කාර්ය භාරය සෘජුවම රසායනාගාර පිළිබඳ පවතින්නක් බවත් පවසන අතර, පුහුණු පාසලක සේවය සම්පූර්ණයෙන්ම වෙනස් ආකාරයේ ක්‍රියාවක් බවත්, මේ පිළිබඳව අවධානය යොමු කර තීරණය කරන ලෙසත් ඉල්ලා ඇත.

උක්ත ඉල්ලීම වෛද්‍ය පර්යේෂණ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ විසින් 2023.03.16 ලිපියෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් වෙත ඉදිරිපත් කර සුදුසු නිර්දේශයක් ලබාදෙන ලෙස ඉල්ලා තිබුනද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් සියළු දෙනා අත්සන් කර මෙම පැමිණිල්ලේ පැමිණිලිකාර පාර්ශවය වන ජී.ජී.කේ විද්‍යාරත්න මහතා නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා තෝරා ගැනීම සුදුසු බවට නැවත නිර්දේශ කර 2023.03.27 දිනැති ලේඛනයෙන් අධ්‍යක්ෂවරයාට දැනුම් දී තිබෙන බවට ලේඛන වලින් සනාථ වේ.

මේ සම්බන්ධව තවදුරටත් කටයුතු කිරීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඒකමතික තීරණය මත කටයුතු නොකර වෛද්‍ය පර්යේෂණ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ නැවත වතාවක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් මගින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරියෙකු පත්කර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් පිළිබඳ උපදෙස් ලබා දෙන ලෙස අංක (MRI/EB/MLT/2017(1) හා 2023.03.30 ලිපියෙන් ඉල්ලා ඇත. එසේම ශ්‍රී ලංකා රජයේ වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදීන්ගේ සංගමය (The Sri Lanka Association of Government Medical

Laboratory Technologists) විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද අංක SLAGMLT/Gen/2023(06) හා 2023.04.08 දිනැති ලිපියෙහි අමාත්‍යාංශ ලේකම් විසින් යොදා ඇති සටහන මඟින් 'ප්‍රශ්නගත නේවාසික වෛද්‍ය රසායනාගාර විද්‍යාඥ තනතුරෙහි පුරප්පාඩු වෛද්‍ය පර්යේෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨතා ලේඛන අනුව සම්මුඛ පරීක්ෂණ තබා සුදුසු අයකු තෝරා ගන්නා ලෙස' උපදෙස් ලබා දී ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ (රසායනාගාර සේවය) අංක DDG/LS/EC/MRI/327/2023 හා 2023.04.10 දිනැති ලිපිය මඟින් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා දැනුවත් කර ඇති අතර, එකී උපදෙස් අනුව වෛද්‍ය පර්යේෂණ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂකගේ අංක MRI/EB/MLT/2017(1) හා 2023.04.17 දිනැති ලිපිය මඟින් වෛද්‍ය පර්යේෂණ ආයතනය තුළ රාජකාරියේ නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් 9 දෙනා වෙතින් නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරී තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා බව දන්වා ඇත.

එසේම වෛද්‍ය පර්යේෂණ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ විසින් 2023.05.23 දිනැතිව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලිපියක් යවමින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් ඔහුට ලබා දී තිබූ උපදෙස් අනුව නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා ජ්‍යෙෂ්ඨත්වය අනුව නිලධාරියෙකු පත්කිරිමට අවශ්‍ය නිර්දේශය ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා ඇති බවටද කරුණු කන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නම් අනාවරණය වේ. එම ඉල්ලීමට අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ජී.ආර්.කේ. කලුගම්පිටිය මහතා උක්ත තනතුර සඳහා පත් කිරිමට නිර්දේශය 2023.05.29 දිනැති ලේඛනයෙන් අධ්‍යක්ෂ වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙත එවා ඇත. උක්ත නිර්දේශයට අනුව MRI/EB/MLT/2017(1) හා 2023.05.29 දිනැති ලේඛනයෙන් ජී.ආර්.කේ. කලුගම්පිටිය මහතා වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරට පත් කර ඇති බවට කරුණු අනාවරණය වේ.

උක්ත පැමිණිලිකරු සිය පැමිණිල්ල මඟින් සඳහන් කර ඇත්තේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා අයදුම්පත් කැඳවූ අවස්ථාවේදී එම තනතුරට අදාළ සියළු සුදුසුකම් ඔහු වෙත ඇති බවත්, ඊට අවශ්‍ය පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම් තිබූ බවත්, විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමෙන් අනතුරුව ඉහළම ලකුණු ප්‍රතිශතයක් ලබා ගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියළු සාමාජිකයින්ගේ එකමතික තීරණය මත අදාළ තනතුර සඳහා නිර්දේශ වී තිබෙන අවස්ථාවක පදනම් විරහිතව වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත ලැබුනු පෙත්සමකට අනුව නැවත වතාවක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට මේ පිළිබඳව සලකා බලා සුදුසු තීරණයක් ලබාදෙන

ලෙස ඉල්ලා තිබුනද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය දෙවන වතාවටත් පැමිණිලිකාර ජී.ජී.කේ විද්‍යාරත්න මහතාව නිර්දේශ කර තිබූ බවයි.

කරුණු එසේ තිබියදී නීත්‍යානුකූල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදුකරන ලද නීත්‍යානුකූල සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව ඉහළ ලකුණු ලැබීම මත අදාළ තනතුරට නිර්දේශ කරන ලද අයදුම්කරුව පත් නොකර සෞඛ්‍ය ලේකම් වෙතින් මේ පිළිබඳ උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලීම් කිරීම සුදුසු ක්‍රමවේදයක්ද යන්න ප්‍රශ්නයක් මතු වේ. අභ්‍යන්තර අයදුම්පත් කැඳවීම මඟින් පැමිණිලිකරු අයදුම්පත් ඉදිරිපත් කර සියළු සුදුසුකම් තිබෙන අවස්ථාවක විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනෙක් ප්‍රමුඛ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඔහුව තෝරාගෙන ඇත්නම් ඉන් ඉදිරියට තවදුරටත් මේ සම්බන්ධව උපදෙස් ලබා ගැනීම සාධාරණ යුක්ති මූලධර්මයන්ට පටහැනි ක්‍රියාවක් බවද නිරීක්ෂණය වේ. තවද ඕනෑම තනතුරක් සඳහා අධ්‍යාපන සුදුසුකම් වෘත්තීමය සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවෙකු විධිමත් ආකාරයෙන් තෝරා ගැනීම සාමාන්‍ය ක්‍රමවේදයක් බවත්, මෙම සියළු ක්‍රමවේදයන් වලින් බැහැරව ජ්‍යෙෂ්ඨතාවය පමණක් පදනම් කරගෙන තනතුරට අයදුම්කරුවෙකු පත්කිරීම නීත්‍යානුකූල ක්‍රියාවක්ද යන ප්‍රශ්නය මතු වේ. සෞඛ්‍ය ලේකම් ගේ උපදෙස් මත ජ්‍යෙෂ්ඨතාවය අනුව මෙම තනතුරට අදාළ පත්කිරීම සිදුකළ යුතු බවට සඳහන් වුවද, මෙවැනි වගකීම් සහිතව ක්‍රියා කරන රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම් වෘත්තීමය සුදුසුකම් නොසලකා හැර ජ්‍යෙෂ්ඨතාවය මත පමණක් පත්කිරීම සුදුසු නොවන තීරණයක් බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

ඉහත සියළු කරුණු සහ දෙපාර්ශවය වෙතින් ඉදිරිපත් වී ඇති සමස්ත ලිඛිත කරුණු දැක්වීම් වලට අවධානය යොමු කිරීමේදී, මෙම පැමිණිලිකාර ජී.ජී.කේ විද්‍යාරත්න උක්ත තනතුර දැරීම සඳහා වූ අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා ඇති අතර, විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඔහුගේ නම අවස්ථා දෙකකදීම අදාළ තනතුර සඳහා වඩාත් සුදුසුම අයදුම්කරු බවට නිර්දේශ ලබා දී ඇති බැවින්, මෙම පැමිණිලිකරුට එකී තනතුර ලබා දීම ඔහුගේ නීත්‍යානුකූල හිමිකමක් බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

නිගමනය :-

ඒ අනුව, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර සඳහා සුදුසුකම් සපුරා තිබියදීත්, හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්ද පැමිණිලිකරු වෙත අදාළ තනතුර ලබා දීමට නිර්දේශ කර තිබියදීත් පැමිණිලිකරුට අදාළ තනතුර ලබා නොදීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ

මූලික අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරන ලැබේ.

**ඒ අනුව, පහත සඳහන් නිර්දේශය කර සිටී.**

ඉහත පරිදි පැමිණිලිකාර ජී.ජී.කේ විද්‍යාරත්න මහතා නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුරට අදාළව සිදුකරන ලද නීත්‍යානුකූල සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය සුදුසුකම් සපුරා ඉහළම ලකුණු සීමාව කරා ප්‍රවිශ්‍යව තිබියදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ඒකමතිකව හා අත්තනෝමතිකව ගන්නා ලද එකී තීරණ තුළින් පැමිණිලිකරුට බරපතල අගතියක් සිදු කර ඇති බැවින් පැමිණිලිකරු නේවාසික වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ 2023.05.29 වන දින තනතුරට පත්කිරීමට කටයුතු කළ යුතුය.

2024. 07.04 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලකා මානව හිමිකම කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර් දේශය ක්‍රියාත්මක ඉදිරිපත් කිරිමට නියමිත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

එල්.ටී.බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- අමාත්‍යතුමා,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

B/RAT